**ශීර්ෂය 415 - ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 24 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූනි 08 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 අත්තිකාරම් ගිණුම් ශේෂ

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අත්තිකාරම් ගිණුමෙහි අත්තිකාරම් ලැබීම් වටිනාකම භාණ්ඩාගාර පොත් (SA – 52) හා දෙපාර්තමේන්තු පොත් (ACA – 5) අනුව රු.15,957,813 වුවත් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය තුළ එම අගය රු.17,662,990ක් වූයෙන් රු.1,705,177ක් වැඩියෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය දක්වා තිබුණි. | SA 52 ට අනුව අත්තිකාරම් ලැබීම් රු.15,957,813ක් වුවද SA 51ට අනුව පෙබරවාරි මාසය තුළ 102 ශීර්ෂය මගින් රු.1,705,177 ක ප්‍රමාණයක් 415 ශීර්ෂය වෙත බැර කොට ඇත. | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ භාණ්ඩාගාර පොත් SA 52 අනුව අත්තිකාරම් ලැබීම්වල වටිනාකම අත්තිකාරම් ලැබීම් යටතේ දැක්විය යුතුය. |
| (ආ) | අත්තිකාරම් ගිණුමෙහි අත්තිකාරම් ගෙවීම් වටිනාකම භාණ්ඩාගාර පොත් (SA – 52) හා දෙපාර්තමේන්තු පොත් (ACA – 5) අනුව රු.15,724,284 වුවත් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය තුළ රු.14,019,107ක් ලෙස දක්වා තිබීමෙන් රු.1,705,177ක් අඩුවෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි දක්වා තිබුණි. | -එම- | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ භාණ්ඩාගාර පොත් SA 52 අනුව අත්තිකාරම් ගෙවීම්වල වටිනාකම අත්තිකාරම් ගෙවීම් යටතේ දැක්විය යුතුය. |

### 1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශයේ නිවාස අංශය විසින් මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණි. | එකඟවෙමි. හානිලේඛනය යාවත් කාලීන කිරීම සඳහා අවශ්‍ය තොරතුරු අදාල අංශ මගින් ගෙන්වා ගෙන ඉදිරි කටයුතු කිරීම මේ වන විට ආරම්භ කර ඇත. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ ඇති ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (see table below) | මූල්‍ය ප්‍රකාශවල ඇතුලත් කොට ඇති අත්තිකාරම් ලැබීම් හා අත්තිකාරම් ගෙවීම් අගයන් SA 52 සමග සැසඳීමේදී 1,705,177 ක ප්‍රමාණයක් පිළිවෙලින් වැඩි හා අඩු ලෙස දක්වා ඇත. නමුත් SA 51 අනුව එනම් වෙනත් ශීර්ෂ හරහා අප ශීර්ෂය වෙත කරන ලද හර හා බැර කිරීම් ලෙස 102 ශීර්ෂය මගින් අදාල 1,705,177 ක ප්‍රමාණය හර හා බැර කොට ඇත. | භාණ්ඩාගාර SA 52 හා අමාත්‍යාංශ ශීර්ෂයට අදාල ශේෂ පිරික්සුම අතර, අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් වටිනාකම්වල වෙනස අග්‍රිම සැසඳුම් ප්‍රකාශයට ගැළපිය යුතුය. |

| විස්තරය | භාණ්ඩාගාර පොත් SA 52 අනුව වටිනාකම රු. | අමාත්‍යාංශ ශේෂ පිරික්සුම අනුව වටිනාකම රු. | වෙනස රු. |
|---|---|---|---|
| අත්තිකාරම් ලැබීම් | 15,957,813 | 11,114,091 | 4,893,722 |
| අත්තිකාරම් ගෙවීම් | 15,724,284 | 12,313,930 | 3,410,354 |

අමාත්‍යාංශයේ ශේෂ පිරික්සුමට වඩා භාණ්ඩාගාර SA 52 හි වැඩියෙන් සටහන් වී ඇති අත්තිකාරම් ලැබීම් රු.4,843,722ක මුදල අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ එකතු කිරීම් වශයෙන් දැක්විය යුතු අතර අමාත්‍යාංශ ශේෂ පිරික්සුමට වඩා භාණ්ඩාගාර පොත් SA 52 හි වැඩියෙන් සටහන් වී ඇති අත්තිකාරම් ගෙවීම් වටිනාකම වන රු.3,410,354 මුදල අග්‍රිම සැසඳුම් ප්‍රකාශයට අඩු කළ යුතු විය. එහෙත් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් අත්තිකාරම් බී ගිණුම වෙනුවෙන් කරන ලද හර කිරීම් ලෙස රු.6,548,898 එකතු කර, අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් බී ගිණුමට කරන ලද හර කිරීම් ලෙස රු.1,705,177ක් අඩුකර තිබුණි.

### 2.2 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වැය විෂයන් 15ක් සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.339,168,000ක මුදලක් වෙන් කරවා ගෙන තිබුණ ද එම මුදලින් කිසිදු වියදමක් වර්ෂය තුළ දරා නොතිබුණු අතර තවත් වැය විෂයන් 32ක අවශ්‍යතාවයට වඩා සියයට 52සිට 99 දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | විදේශ ගමන් තාවකාලිකව අත්හිටුවීම, වසංගතය අතරතුර කාර්යාලය සම්පූර්ණ ධාරිතාවයෙන් ක්‍රියාත්මක නොවීම, වැරදීමකින් ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් ප්‍රතිපාදන ලබාදීම, වියදම් සීමා කිරීම, නැවත පදිංචි කිරීමේ ඒකකය නිවාස | වියදම් පැහැදිලිව හඳුනාගෙන අවශ්‍යතාවලට අනුව ප්‍රතිපාදන වෙන් කරවා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අමාත්‍යාංශය සමග ඒකාබද්ද කිරීමෙන් පසු මෙම වියදම් පුරෝකථනය කල පරිදි සිදු නොවීම හා කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘතිය පමා කිරීමේ හේතුවෙන් මෙම ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | |
| (ආ) | අමාත්‍යාංශ විෂයට අදාල නොවන මරදගහමුල සහල් විකිණීමේ වෙළෙඳ කුටි 115ක් ඉදිකිරීම සඳහා අමාත්‍යාංශයේ වැය විෂය අංක 2-4-65-2506/11 ක සඳහා පරිපූරක ඇස්තමේන්තු මගින් රු.37,150,000 වෙන් කරවා ගෙන එම මුදලින් රු.32,125,058ක වියදමක් දරා තිබුණු අතර වෙන් කරවා ගෙන තිබූ මුදලින් සියයට 14 ක් එනම් රු.5,024,942ක් ඉතිරි වී තිබුණි. | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් ඉදිරිපත් කරනු ලබන බිල්පත් අනුව අමාත්‍යාංශය මගින් අදාල ව්‍යාපෘතිය සඳහා ගෙවීම් සිදු කරනු ලබන අතර 2021 වර්ෂය තුල ගෙවීම් සඳහා බිල්පත් ඉදිරිපත් කොට ඇත්තේ රු.32,125,058 ක් සඳහා පමණි. | අමාත්‍යාංශ විෂයට අදාල වියදම් පැහැදිලිව හඳුනාගෙන අවශ්‍යතාවයට අනුව ප්‍රතිපාදන වෙන් කරවා ගත යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ වැය විෂයන් 03ක් සඳහා ලබාදී තිබූ ප්‍රතිපාදනවලින් සියයට 61ත් සියයට 70ක් අතර ප්‍රමාණයකින් මු.රෙ.66 ප්‍රතිපාදන මාරු කිරීම් යටතේ වෙනත් වැය විෂයන් සඳහා මාරුකර තිබුණි. | වසංගත කාලය තුල උපරිම ධාරිතාවයෙන් කාර්යාල වැඩකටයුතු සිදු නොවීමත්, නැවත පදිංචි කිරීමේ අංශයට පත් කරන ලද නව නිළධාරීන් හේතුවෙන් එම පරිශ්‍රය අළුත් වැඩියා කිරීමට සිදුවීමත් වසංගත කාලය තුල පුහුණු වැඩසටහන් නොපැවැත්වීමේ හේතුවෙන් මෙම ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | වියදම් පැහැදිලිව හඳුනාගෙන අවශ්‍යතාවයට අනුව ප්‍රතිපාදන වෙන් කරවා ගත යුතුය. |

**2.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

**-------------------------------------------------------------**

| **නිරීක්ෂණය** | **අමාත්‍යාංශයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මෙම අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා හඳුන්වා දී ඇති අභ්‍යන්තර පාලන පද්ධතීන්වල සඵලදායිතාවය වරින්වර සමාලෝචනය කරනු ලබන අතර හඳුනාගනු ලබන අඩුපාඩු පිළිබඳව චක්‍රලේඛ මගින් උපදෙස් නිකුත් කරමින් අදාල මූල්‍ය පාලන පද්ධති සඵලදායිව පවත්වාගෙන යැමට කටයුතු කරනු ලබයි. මේ පිළිබඳව කරනු ලබන සමාලෝචනයන් ඉදිරියේදී විගණකාධිපති වෙතද දැනුම් දීමට කටයුතු කරමි. | වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) | 2019 නොවැම්බර් 28 දිනැති අංක 07/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | මුදල් රෙගුලාසි 880 යටතේ ඇප තැබිය යුතු රජයේ නිලධාරින් ඇප තබා නොතිබුණි. | ඇප තබා නොමැති නිළධාරීන්ගෙන් ඇප අය කිරීම සඳහා අදාල ගිණුම් විවෘත කිරීමේ කටයුතු මේ වන විට ආරම්භ කර ඇත. | රෙගුලාසිය ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් ඇප තැබිය යුතුය. |
| (ii) | 2019 අප්‍රේල් 08 දිනැති අංක 02/2019 දරන මුදල් අමාත්‍යාංශ අයවැය චක්‍රලේඛ | ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් අයවැයකරණයට අදාල දත්ත තොරතුරු රැස් කිරීම හා සෑම අමාත්‍යාංශයකම ස්ත්‍රී පුරුෂභාවය මත පදනම් වූ කේන්ද්‍රීය ඒකක පිහිටුවීම සිදු කළ යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |

## 2.5 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයට අදාල රු.753,881ක වියදම් 2022 වර්ෂයේ ගෙවා තිබූ අතර එම වියදම් බැරකම් පිළිබඳ ප්‍රකාශයට ඇතුළත් කර නොතිබුණි. | එකඟ වෙමි. අදාල බැරකම් මග හැරී ඇත. | වර්ෂයට අදාල සියලු බැරකම්, බැරකම් පිළිබඳ ප්‍රකාශයට ඇතුළත් කළ යුතුය. |

## 2.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැදුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැඩ තහනම් කර ඇති නිලධාරින්ගෙන් රු.199,673ක ණය ශේෂයක් වර්ෂ 05කට වැඩි කාලයක සිට අයවීමට ඇති අතර, සේවය අතහැර ගොස් ඇති තවත් නිලධාරියෙකුගෙන් රු.47,050ක | වැඩ තහනම් වී ඇති නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.34,460ක ණය ශේෂය රු.5,000 බැගින් මාසිකව ගෙවීම් සිදු කරනු ලබයි. 2011වර්ෂයේ වැඩ තහනමකට ලක්වී ඇති නිලධාරිනියට අදාල ණය ශේෂය වූ රු.117,690ක මුදල ඉදිරියේ දී අයකර ගැනීමට | අයවිය යුතු ණය ශේෂ ප්‍රමාදයකින් තොරව අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |

| | |
|---|---|
| ණය ශේෂයක් වර්ෂ 05කට වැඩි කාලයක සිට අයවීමට තිබුණි. | ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි.<br>වැඩ තහනම් කර ඇති තවත් නිලධාරියෙකුගේ රු.47,524ක්වූ ආපදා ණය ශේෂය ඇපකරුගෙන් රු.1,680 බැගින් වූ වාරික මාසිකව අය කරනු ලබයි.<br>සේවය අතහැර ගොස් ඇති කළමනාකරණ සේවා නිලධාරිගේ 2021.12.31 දිනට රු.47,050.00ක ණය ශේෂය අයකර ගනිමින් සිටී. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------------

### 3.1 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

-----------------------------------------

**විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය**

2018 වර්ෂයේ හා 2019 වර්ෂයේ ආරම්භ කර අවිච්ඡේදව පැවති පහත සඳහන් නිවාස ව්‍යාපෘතිවල වැඩ අවසන් කිරීමට ක්‍රියා කර නොතිබුණි.

| ව්‍යාපෘතිය | දරා ඇති වියදම රු.මිලියන | ව්‍යාපෘතිය ආරම්භ කර ඇති වර්ෂය | ව්‍යාපෘතිය නතර කර ඇති කාලය අවුරුදු | ලඟා කර ගෙන තිබූ භෞතික ප්‍රගතිය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | ජනෙල් මට්ටම දක්වා නිම වී තිබූ නිවාස | වහල මට්ටම දක්වා නිම වී ඇති නිවාස | වහල නිමවී තිබූ නිවාස | සම්පූර්ණ වශයෙන් නිම කර තිබූ නිවාස |
| ------------- | ----------- | ------- | --------- | -------- | ------- | ------- | --------- |
| උතුරු නැගෙනහිර නිවාස වැඩ සටහන (නව) | 1,243 | 2019 | 02 | 3,923 | 900 | 662 | 432 |
| ග්‍රාම ශක්ති ආදර්ශ ගම්මාන වැඩ සටහන (නව) | 367 | 2019 | 02 | 771 | 166 | 471 | 30 |

**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම:** 2015 – 2019 ක්‍රියාත්මක කල ගම්මාන වැඩ සටහන යටතේ සම්පූර්ණ වැඩ සටහන නිම කිරීම සඳහා 2020 – 2021 ප්‍රතිපාදන වෙන් නොවූ අතර අයකිරීම් ප්‍රවාහයේ හා සැබෑ නිවාස අවශ්‍යතාවය ඇති පුද්ගලයින් සඳහා පමණක් වාරික මුදල් ලෙස රු. මිලියන 59.405 ක් වැය කර ඇත.
අවිච්ඡේද ආදර්ශ ගම්මාන වැඩ සටහනේ

**නිර්දේශය:** අවිච්ඡේදව පැවති නිවාස ව්‍යාපෘතිවල වැඩ අවසන් කිරීමට ක්‍රියා කළ යුතුය.

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ග්‍රාම ශක්ති ආදර්ශ ගම්මාන වැඩ සටහන (අවිච්ඡේද) | 599 | 2018 | 03 | 470 | 332 | 980 | 443 | ප්‍රතිලාභීන්ගේ වාරික මුදල් නිදහස් කිරීම සඳහා දිස්ත්‍රික්වල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා ගෙන, දිස්ත්‍රික් මට්ටමින් අවශ්‍යතාවය හඳුනා ගැනීමට මේ වන විට දිස්ත්‍රික් කාර්යාල දැනුවත් කර ඇත. |
| වැලිඔය නිවාස ව්‍යාපෘතිය | 32 | 2019 | 02 | 80 | 35 | 27 | - | |
| ගංවතුරෙන් හානි වූ නිවාස වැඩිදියුණු කිරීමේ නිවාස වැඩසටහන | 530 | 2019 | 02 | 1,650 | 474 | 82 | - | |
| විසිරි නිවාස වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (නව) | 87 | 2019 | 02 | 331 | 239 | 1,553 | 394 | |

**3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මිහිඳු නිවහන නිවාස ව්‍යාපෘතිය<br>මෙම ව්‍යාපෘතිය සඳහා 2021 වර්ෂයේ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය ලෙස රුපියල් මිලියන 750ක් වෙන් කර තිබුණත් 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රගති වාර්තාවට අනුව දරා ඇති වියදම රුපියල් මිලියන 196ක් වූ අතර ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය සියයට 26ක් විය. වර්ෂයේ ව්‍යාපෘතිය මගින් සම්පූර්ණ වශයෙන් නිවාස 500ක් ඉදිකිරීමට සැලසුම්කර තිබුණත් ඉදිකර තිබූ නිවාස සංඛ්‍යාව 201ක් විය. ඒ අනුව ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 40ක් පමණක් විය. | ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදි සිදු වූ ප්‍රමාදය වැඩ සටහන් ආරම්භ කර ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීමට හේතු විය. එහෙත් 2021 වසරේ නිවාස ඒකක 758 ආරම්භ කර ඇති අතර දරා ඇති වියදම රු. මිලියන 196 කි. එම වසරේ නිම කර ඇති නිවාස සංඛ්‍යාව 201කි. | නියමිත කාලය තුළ ව්‍යාපෘති ඉටු කිරීමට හැකිවන පරිදි සැලසුම් සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ආදර්ශ ගම්මාන නිවාස ව්‍යාපෘතිය 2019 (අවිච්ඡේද) (ණය)<br>මෙම අවිච්ඡේද නිවාස ව්‍යාපෘතිය සඳහා 2021 වර්ෂයේ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය ලෙස රුපියල් මිලියන 172ක් වෙන් කර තිබූ අතර 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රගති වාර්තා අනුව දරා ඇති වියදම රුපියල් මිලියන 55ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රගතිය සියයට 32ක් පමණක් විය. ව්‍යාපෘතියේ අවිච්ඡේදව පැවති නිවාස ඒකක 1,720ක් මෙම වර්ෂය තුළ නිම කිරීමට සැලසුම් කර තිබුණත් නිම කර තිබූ නිවාස සංඛ්‍යාව 395 පමණක් විය. ඒ අනුව භෞතික ප්‍රගතිය සියයට 23ක් විය. මෙම ව්‍යාපෘතිය 2019 වර්ෂයේ අවසාන කිරීමට නියමිත වූ අතර, ප්‍රමාද කාලය අවුරුදු 02කි. | මෙම අවිච්ඡේද නිවාස ව්‍යාපෘතිය යටතේ 2021 වර්ෂය තුල මිලියන 59.405 ක මුදලක් ප්‍රතිලාභීන් වෙත ලබාදී ඇත. | ඉලක්කගත කාර්යයන් සම්පූර්ණ කළ යුතුය. |
| (ඇ) | සාංචි ආරච්චිවත්ත නිවාස අළුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය<br>මෙම ව්‍යාපෘතිය සඳහා 2021 වර්ෂයේ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය ලෙස රුපියල් මිලියන 68ක් වෙන්කර තිබුණත් ව්‍යාපෘතිය සඳහා වර්ෂය තුළ කිසිඳු වියදමක් දරා නොතිබුණි. 2021 වර්ෂයේ ප්‍රගති වාර්තා අනුව මෙම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 10ක් විය. | මෙම නිවාස අළුත් වැඩියාව සඳහා ඇස්තමේන්තුගත මුදල රු. මිලියන 85 ක් වන අතර ඉන් මිලියන 30 ක් 2019 වර්ෂයේ නගමු පුරවර වැඩ සටහනේ ඉතිරි ප්‍රතිපාදන වලින් සහ රු. මිලියන 55 ක් 2021 වර්ෂයේ ප්‍රතිපාදන වලින් ලබා දී ඇත. | නියමිත කාලය තුළ ඉටුකළ හැකි ව්‍යාපෘති සඳහා පමණක් ප්‍රතිපාදන වෙන් කරවා ගත යුතුය. |
| (ඈ) | ඇල්පිටිවල නිවාස යෝජනා ක්‍රමයේ ජල ටැංකිය, මල ප්‍රවාහන මාර්ග සහ කාණු පද්ධතිය අළුත්වැඩියා කිරීම<br>2021 වර්ෂයේ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රුපියල් මිලියන 07ක් වූ අතර, ප්‍රගති වාර්තා අනුව 2021 දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 4.5ක් වියදම් දරා තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රගතිය සියයට 64ක් වුවත් ලබා තිබූ භෞතික ප්‍රගතිය සියයට 25ක් පමණක් විය. | දැනට වැඩ සිදු කරමින් පවතී. | ඉලක්කගත කාර්යයන් සම්පූර්ණ කළ යුතුය. |
| (ඉ) | හිඹුටු උයන නිවාස යෝජනා ක්‍රමයේ අළුත්වැඩියා කටයුතු<br>මේ සඳහා 2021 වර්ෂයේ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රුපියල් මිලියන 20ක් වූ අතර 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රගති වාර්තා අනුව දරා තිබූ වියදම රුපියල් මිලියන 19.5ක් වුවත් කිසිඳු භෞතික ප්‍රගතියක් ලබා නොතිබුණි. | මේ සඳහා ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය විසින් ඉදිරිපත් කර ඇති දළ ඇස්තමේන්තුව රු.මිලි. 26 කි. පොම්ප ඇතුළු | ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතියට සාපේක්ෂව භෞතික ප්‍රගතියක් |

| | | | |
|---|---|---|---|
| | | උපාංගවල මිල සීඝ්‍රයෙන් ඉහල යෑම නිසා නව ඇස්තමේන්තුවක් ලබා දීමට ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය විසින් කටයුතු කරන බැවින් ඒම ඇස්තමේන්තුව ලද පසු 2022 වර්ෂයේ වෙන් කරන ලද රු.මිලි.100න් කොටසක් යොදවා එම කාර්යය සිදු කිරීමට කටයුතු කරන බව දන්වමි. | ලබාගත යුතුය. |
| (ඊ) | කොළඹ ප්‍රදේශයේ නිවාස යෝජනා ක්‍රමවල ජල පොම්ප සවි කිරීම හා පොම්පාගාර අළුත්වැඩියා කටයුතු<br>2021 වර්ෂයේ ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ලෙස රුපියල් මිලියන 05ක් වෙන්කර තිබූ අතර, 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රගති වාර්තා අනුව රුපියල් මිලියන 05ක වියදමක් දරා තිබුණත් කිසිදු භෞතික ප්‍රගතියක් පෙන්නුම් කර නොතිබුණි. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර කොන්ත්‍රාත් ආයතනයක් තෝරාගෙන පොම්ප මිලදී ගැනීම සඳහා රු.මිලි. 3 ක චෙක්පතක් ලියාතිබුණද පොම්ප මිල ගණන වැඩිවීම මත එම ආයතනය එකඟ වූ වටිනාකමට පොම්ප ලබා දීම ප්‍රතික්ෂේප කර ඇත. ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර නැවත කොන්ත්‍රාත් ආයතනයක් තෝරා ගැනීමට සිදු වී ඇත. | ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතියට සාපේක්ෂව භෞතික ප්‍රගතියක් ලබාගත යුතුය. |
| (උ) | උතුරු සහ නැගෙනහිර පළාත්වල නැවත පදිංචි කිරීමේ කටයුතු වේගවත් කිරීමේ ව්‍යාපෘතිය<br><br>2021 වර්ෂයේ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය ලෙස රුපියල් මිලියන 1,435ක් වෙන් කර තිබූ අතර, වර්ෂය තුළ රුපියල් මිලියන 722ක් වියදම් දරා තිබුණි. ඒ අනුව ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය සියයට 50 වුවද, 2021 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය සියයට 45ක් පමණක් විය. | අදහස් දක්වා නොමැත. | නියමිත කාලය තුළ ව්‍යාපෘති නිම කිරීමට හැකිවන පරිදි සැලසුම් සකස් කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඍ) **උතුරු සහ නැගෙනහිර පළාතේ ගැටුම්වලින් පීඩාවට පත් පවුල් සඳහා සම්ප්‍රදායික ගඩොල් සහ මෝටර් වර්ගයේ ස්ථිර නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතිය**<br>මෙම ව්‍යාපෘතිය සඳහා 2021 වර්ෂයේ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රුපියල් මිලියන 5,000ක් වුවත් 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රගති වාර්තාවට අනුව දරා ඇති වියදම රුපියල් මිලියන 3,746කි. ඒ අනුව මූල්‍ය ප්‍රගතිය සියයට 75කි. ව්‍යාපෘතිය සඳහා නිවාස 5,953 නිම කිරීමට සැලසුම් කර තිබුණත් සම්පූර්ණ වශයෙන් නිම කර තිබූ නිවාස සංඛ්‍යාව 2,533ක් වන අතර වහල දක්වා නිවාස 2,326ක් සහ බිත්ති මට්ටම දක්වා නිවාස 142ක් ඉදිකර තිබුණි. ප්‍රගති වාර්තාවට අනුව ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 60ක් පමණක් විය. | අපේක්ෂිත දිනට නිම කළ යුතු නිවාස ඒකක 5953 ක් වුවත් සම්පූර්ණයෙන්ම නිම කළ හැකි වී ඇත්තේ 2533 කි.වහල මට්ටම දක්වා නිවාස 2326 ක්ද, බිත්ති මට්ටම දක්වා නිවාස 896ක්ද, අත්තිවාරම් මට්ටම දක්වා නිවාස 142ක්ද ඉදිකර ඇත. 2021 වර්ෂයේදී රට තුළ පැතිර ගිය කොවිඩ් වසංගත තත්ත්වය නිසා විවිධ සීමාවන් යටතේ කටයුතු කිරීමට සිදු වීම හා පසුගිය කාලය තුළ ශීඝ්‍රයෙන් භාණ්ඩ හා සේවා මිල ඉහල යාම මෙන්ම සමහර අමුද්‍රව්‍ය (සිමෙන්ති වැනි) සපයා ගැනීමේ දුෂ්කරතා මතුව තිබුණි. ඊට අමතරව දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත යවනු ලැබූ ප්‍රතිපාදන සඳහා ප්‍රමාණවත් අක්මුදල් නොලැබීම හේතුවෙන් රුපියල් මිලියන1173 ක් ගෙවීම් කිරීමට නොහැකිව ඇත. | නියමිත කාලය තුළ ව්‍යාපෘති නිම කිරීමට හැකිවන පරිදි සැලසුම් සකස් කළ යුතුය. |
| (එ) **උතුරු නැගෙනහිර පළාතේ ගැටුම්වලින් පීඩාවට පත් පවුල් සඳහා නව තාක්ෂණික පිරිවැය ඵලදායී ස්ථිර නිවාස ඉදිකිරීම**<br>මෙම ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රුපියල් මිලියන 400 වන අතර 2021 දෙසැම්බර් 31 දිනට දරා ඇති වියදම රුපියල් මිලියන 03කි. ඒ අනුව මූල්‍ය ප්‍රගතිය සියයට 01ක් පමණක් විය. ව්‍යාපෘතිය සඳහා නිවාස 300ක් නිම කිරීමට සැලසුම් කර තිබුණද සම්පූර්ණ වශයෙන් නිම කර තිබූ නිවාස සංඛ්‍යාව 12ක් පමණක් විය. | එකඟ වෙමි.<br>කොවිඩ් වසංගත තත්ත්වය හා මෙම නිවාස ඉදිකිරීමේ ආකාරය නව තාක්ෂණික සහ අත්හදා බැලීම් වලින් යුතු නව තත්ත්වයක් බැවින් එහි ඇති අඩුපාඩු තාක්ෂණික දෝෂ මඟහරවා ගනිමින් | නියමිත කාලය තුළ ව්‍යාපෘති නිම කිරීමට හැකිවන පරිදි සැලසුම් සකස් කළ යුතුය. |

| | | |
|---|---|---|
| | නැවත ඇගයීමට ලක්කර ක්‍රියාත්මක කිරීමට යාමේදී සිදුව ඇති ප්‍රමාදයන්ය. | |

**3.3 විදේශ ආධාර ව්‍යාපෘති**

------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ඉන්දියන් ආධාර යටතේ ක්‍රියාත්මක වන පූජා මාදුළුවාවේ සෝභිත නාහිමි නිවාස ව්‍යාපෘතිය 2018 වර්ෂයේ ආරම්භ කර 2019 වර්ෂයේ අවසන් කිරීමට නියමිතව තිබුණද මේ වන විට එම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු නතර වී ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා මෙතෙක් දරා ඇති වියදම රුපියල් මිලියන 47ක් බවද භෞතික ප්‍රගතිය සියයට 30 බවද අමාත්‍යාංශයේ 2020 වර්ෂයේ කාර්යසාධන වාර්තාව අනුව නිරීක්ෂණය විය. | කොන්ත්‍රාත් සමාගමේ මූල්‍ය කළමණාකරන ගැටළු හේතුවෙන් ඉදිකිරීම් ප්‍රගතිය ඉතා දුර්වල වීම නිසා කොන්ත්‍රාත් ගිවිසුම 2019.11.12 දින අවලංගු කර ඇත. ඉන් අනතුරුව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යංශය (CECB) ලවා ඉතිරි වැඩ කොටස් ඉටු කරවා ගැනීමට 2020.03.18 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ගිවිසුම් අත්සන් කර වැඩ ආරම්භ කර ඇත. | ඉලක්ක ගත කාර්යයන් සම්පූර්ණ කළ යුතුය. |

(ආ) ඉන්දියන් ආධාර යටතේ ක්‍රියාත්මක වන අනෙකුත් ව්‍යාපෘති 04හි අමාත්‍යාංශ ප්‍රගති වාර්තා අනුව 2021 දෙසැම්බර් 31 දින වන විට ප්‍රගතිය පහත පරිදි විය.

| ව්‍යාපෘතිය | ව්‍යාපෘති කාල සීමාව | ව්‍යාපෘති මූල්‍ය වටිනාකම රු. මිලියන | දරා ඇති වියදම රු. මිලියන | වැඩ ආරම්භ කර ඇති නිවාස ගණන | නිම කර ඇති නිවාස ඒකක ගණන |
|---|---|---|---|---|---|
| දීප ව්‍යාප්ත ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය | 2017-2020 | 300 | 265 | 600 | 340 |

| | | | | | |
|---|---|---|---|---|---|
| දකුණු පළාත් ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය I | 2017-2020 | 300 | 183 | 600 | 40 |
| උතුරු පළාත් ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය | 2018-2021 | 300 | 94 | 278 | 58 |
| දකුණු පළාත් ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය II | 2018-2021 | 300 | 66 | 519 | 1 |

මේ අනුව වර්ෂ 04කට අධික කාලයක් ගතවී තිබුණත් ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි.

### 3.4 අපේක්ෂිත අරමුණු ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නැවත පදිංචි කිරීමේ අංශයේ 2021 වර්ෂයේ උතුරු හා නැගෙනහිර පළාත්වල නැවත පදිංචි කිරීමේ කටයුතුවලට අදාල කරන ලද පසු විපරම් වාර්තා අනුව මඩකලපුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් අයන්තිමලේ ග්‍රාම නිලධාරි වසම තුළ පෙර වර්ෂයේ අමාත්‍යාංශ ප්‍රතිපාදනවලින් රුපියල් මිලියන 68ක පමණ මුදලක් වැය කර ඉදිකර ඇති සහල් සැකසුම් මධ්‍යස්ථානයේ සියලු කටයුතු අවසන් කර තිබුණත් එහි සහල් සැකසුම් කටයුතු ආරම්භ කර නොමැත. | පිළිගනිමි.<br>2020 වර්ෂයේ ප්‍රතිපාදන යොදවා ඉදිකර ඇති අතර ඒ සඳහා එම වසර තුළ රුපියල් මිලියන 68 ක් වැය කර තිබුණි. 2021.02.08 දින කළ ක්ෂේත්‍ර පරීක්ෂණයකදී එම සහල් සැකසීමේ මධ්‍යස්ථානය සම්පූර්ණ කිරීම සඳහා සහල් තැම්බීමේ යන්ත්‍ර හා වියළීමේ යන්ත්‍රලබා දිය යුතු බව නිරීක්ෂණය විය. 2021 වර්ෂය තුළ ඒ සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන අමාත්‍යාංශය සතුව නොතිබුණු බැවින් එම කාර්යය ඉටු කිරීමට නොහැකි විය. | භාණ්ඩාගාර ප්‍රතිපාදන මුදල් වැය කර නිම කර ඇති ව්‍යාපෘති, අපේක්ෂිත අරමුණු ලභා කර ගැනීමට යොදවා ගත යුතුය. |
| (ආ) | මරදගහමුල්ල සහල් ගබඩා සංකීර්ණයට අනුබද්ධිත සහල් විකිණීමේ වෙළෙඳ කුටි 115ක් ඉදිකිරීම් ව්‍යාපෘතිය ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් 2014 සැප්තැම්බර් 01 දින ආරම්භ කර වර්ෂ 05කට ආසන්න කාලයක් තිස්සේ අතරමග නතර කර තිබුණි. නැවත 2020 දෙසැම්බර් මෙම අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මුදල් යොදවා එය ආරම්භ කර තිබුණි. 2014 වර්ෂයේ සිට මේ දක්වා ව්‍යාපෘති වියදම් ලෙස රු.135,975,907ක් වැය කර තිබූ අතර, ව්‍යාපෘතිය ආරම්භ කර මේ වන විට වසර 07කට ආසන්න කාලයක් ගතවී තිබුණත් ව්‍යාපෘතියේ කටයුතු අවසන් කර නොතිබීමෙන් ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට නොහැකි වී ඇත. | 2014 දෙසැම්බර් මසට පසුව මෙම ව්‍යාපෘතිය සඳහා හිමිකාරිත්වය දැරීමට කිසිදු අමාත්‍යාංශයක් හෝ ආයතනයක් නොමැතිවීම නිසා වසර 05 ක පමණ කාලයක් ඉදිකිරීම් කටයුතු නතර කර ඇත. 2020.02.12 දින ජනාධිපති ලේකම් කාර්යාලයේදී පැවති සාකච්ඡාවේදී මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඉදිරි වැඩ කටයුතු කිරීම සඳහා වගකීම මෙම අමාත්‍යාංශය වෙත පැවරිණි.මෙම ව්‍යාපෘතියේ වැඩ කටයුතු වලින් 99% ක ප්‍රමාණයක් මේ වන විට අවසන් කොට ඇත. | නියමිත කාලය තුළ ව්‍යාපෘතියේ ඉදිකිරීම් නිම කර අදාල කාර්යයන් සඳහා යොදා ගත යුතුය. |

### 3.5 අනාර්ථික ගනුදෙනු

-----------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයේ නැවත පදිංචි කිරීමේ අංශය මගින් උතුරු හා නැගෙනහිර පළාත්වල නැවත පදිංචි කිරීමේ කටයුතුවලට අදාල පසු විපරම් වාර්තා අනුව, නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලියේ මූලික හා අත්‍යවශය වන පදිංචිය සඳහා සුදුසු නිවසක් ලබා දීම හෝ තාවකාලිකව නිවසක් ඉදිකර නොමැති අවස්ථාවලදී වැසිකිළි ඉදිකිරීම වැනි අතුරු අවශ්‍යතා සපුරා දී තිබුණි. එම වැසිකිළි ප්‍රයෝජනයට නොගෙන විනාශවීමට ඉඩ හැර තිබීම නිසා ප්‍රතිලාභීන්ට ප්‍රයෝජනයක් නොතිබීම සහ භාණ්ඩාගාර අරමුදල් නාස්ති වී යාමක් නිරීක්ෂණය වේ. | තාවකාලික නිවාස ලබාදුන් පවුල් සඳහා ස්ථිර නිවාස ලබා දීම දීර්ඝ කාලයක් ප්‍රමාද වන අවස්ථා වලදී ඔවුන්ගේ අවශ්‍යතා සඳහා වෙනත් ස්ථාන හෝ ඥාති හිතමිත්‍රාදීන් වෙත යාම සිදුවන අවස්ථාවලදී තාවකාලික නිවාස සහ සනීපාරක්ෂක ඒකක පරිහරණයෙන් තොර විය හැකි අතර ඔවුන්ට ස්ථිර නිවසක් ලබා දෙන තුරු එම තත්ත්වය පැවතිය හැක. | රජයේ අරමුදල් ප්‍රයෝජනයක් නොමැති කාර්යයන් සඳහා නොයෙදිය යුතුය. |

### 3.6 වත්කම් කළමනාකරණය

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශය සතු වාහන 09 ක් ප්‍රජා යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයට ලබාගෙන ඇති අතර මෙම වාහන මෙතෙක් මෙම අමාත්‍යාංශයට භාර දී නොතිබුණි. අංක WPKA-0002 දරන ටොයොටා ලෑන්ඩ්කෲසර් ජීප් රථය පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාලයට 2021 ජනවාරි 01 දින සිට ලබා දී තිබුණි. | අංක WP KA – 0002 ටොයොටා ලෑන්ඩ්කෲසර් ජීප් රථය නැවත පදිංචි කිරීම් අංශය විසින් පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය වෙත ලබා දී ඇත. | මෙම වාහන අමාත්‍යාංශයට නැවත ලබා ගත යුතුය. |
| (ආ) | කල්බදු ලීසින් ක්‍රමය යටතේ 2016 වර්ෂයේ ලබාගෙන ඇති අංක CAF 4619 දරන ජීප් රථය සහ අංක PG 1773 දරන ඩබල් කැබ් රථය කෘෂිකර්ම අමාත්‍යාංශයේ ධාවන කටයුතු සඳහා ලබා ගෙන ඇති අතර, එම වාහන දෙක මෙම අමාත්‍යාංශයට මෙතෙක් ලබාගෙන නොතිබුණි. | ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් මෙම අමාත්‍යාංශයේ CAF 4619 ජීප් රථය සහ PG 1773 ඩබල් කැබ් රථය කල් බදු අවසන් වී ඇති බව ලිඛිතව දැනුම් දී නොමැති බැවින් අදාල වාහන මෙම අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට කටයුතු කර නොමැති බව දන්වා සිටිමි. | මෙම වාහන අමාත්‍යාංශයට පවරා ගත යුතු වීම. |

| | | |
|---|---|---|
| (ඇ) අමාත්‍යාංශයේ නැවත පදිංචි කිරීමේ අංශයට අයත් නිෂ්ක්‍රීයව ඇති වාහන 03ක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | මෙම වාහන අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

**3.7 පාඩු හා හානි**

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පසුගිය වර්ෂයේ කපාහැර නොමැතිව ඉදිරියට ගෙන ගිය රු.640,361ක් වූ වාහන අනතුරු 09 ක පාඩු හා හානි, පාඩු හා හානි ලේඛනය අනුව කපාහැර නොතිබුණු අතර, එම ශේෂයන් මෙම වර්ෂයේ ගිණුමෙහි පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයට ගෙන නොතිබුණි. | එකඟ වෙමි. මෙම කරුණු යටතේ පෙන්වා දී ඇති හානි හා පාඩු ඉදිරියේදී ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ. | කපා හැර නොමැති පාඩු හා හානි ගිණුමෙහි පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයට ගත යුතුය. |
| (ආ) වාහන 02 කට අදාලව රු.352,017 ක් වූ හානි හා පාඩු නැවත පදිංචි කිරීමේ අංශයේ හානි හා පාඩු ලේඛනයට ගෙන නොතිබුණි. | -එම- | පාඩු හා හානි ලේඛනය අනුව හානි හා පාඩු ගිණුම නිවැරදි විය යුතුය. |
| (ඇ) නිවාස අංශයේ වාහන අනතුරු ලේඛනය අනුව CAB 8793 වාහනය 2021 ජනවාරි 30 අනතුරට පත්වීම මත රක්ෂණයෙන් ආවරණය නොවූ රු.24,239 පාඩුව අමාත්‍යාංශ හානි ලේඛනයේ ඇතුළත් කර නොතිබූ අතර, සමාලෝචිත වර්ෂයේ ගිණුමෙහි පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයට ගෙන නොතිබුණි. | එකඟ වෙමි. මෙම කරුණු යටතේ පෙන්වා දී ඇති හානි හා පාඩු ඉදිරියේදී ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ. | රක්ෂණයෙන් ආවරණය නොවූ වාහන අනතුරුවලින් සිදුවූ පාඩුව හානි හා පාඩු ලේඛනයට සහ ගිණුමෙහි පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයට ගත යුතුය. |

**3.8 කළමනාකරණ දුර්වලතා**

**---------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේ උතුරු නැගෙනහිර පළාත්වල නැවත පදිංචි කිරීමේ කටයුතුවලට අදාලව අමාත්‍යාංශ වැය විෂය යටතේ රු.4,539,450,363 වියදමක් උතුරු නැගෙනහිර දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා දරා තිබූ අතර, එම මුදල්වලින් අපේක්ෂිත අරමුණු ඉටුවී ඇත්ද යන්න පසුවිපරම් කර නොතිබුණි. මෙම වියදම අමාත්‍යාංශයේ මුළු වියදමෙන් සියයට 34කි. | ව්‍යාපෘති ආරම්භයේ සිට මාසිකව, ත්‍රෛමාසිකව, අර්ධ වාර්ෂිකව හා වාර්ෂිකව එම ව්‍යාපෘතීන්හි භෞතික හා මූල්‍ය ප්‍රගතිය දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල අදාළ නිළධාරීන්ගේ සහභාගීත්වයෙන් සමාලෝචනය කර ඇත. | අමාත්‍යාංශය ලබා දී ඇති මුදල් අපේක්ෂිත අරමුණු සඳහා දරා ඇත්ද යන්න පිළිබඳ පසු විපරම් කළ යුතුය. |
| (ආ) | 2018 අයවැය යෝජනාවට අනුව 1972 අංක 07 දරන ගෙවල් කුළී පනත සංශෝධනය කළ යුතු වුවත් මෙතෙක් එම පනත සංශෝධනය කර නොතිබුණි. ගතවී ඇති කාලය අවුරුදු 03කි. | අමප/21/1693/330/102 හා 2021.09.27 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අධිකරණ අමාත්‍යාංශය වෙත ගෙවල් කුළී පනත සංශෝධනය කිරීමේ වගකීම පවරා ඇත.ඒ අනුව තව දුරටත් මෙම අමාත්‍යාංශය විසින් ගෙවල් කුලී පනත සංශෝධනය කිරීම සම්බන්ධ කටයුතු සිදු නොකරන බැවින් ඒසම්බන්ධ ලේඛණ අධිකරණ අමාත්‍යාංශයට පිටපතක් සහිතව නීති කෙටුම්පත් සම්පාදන දෙපාර්තමේන්තුව වෙත 2022.03.22 දිනැති ලිපිය මගින් යොමු කර ඇත. | මෙම පනත කඩිනමින් සංශෝධනය කළ යුතු වීම. |
| (ඇ) | 2017 ජූලි 24 දින සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා රාජ්‍ය ආයතනවලින් අමාත්‍යාංශයේ ස්ථාවර තාක්ෂණික කමිටු අනුමැතිය ලබා ගැනීමට එවා තිබූ කොන්ත්‍රාත් 17ක් සඳහා 2021 වර්ෂය අවසාන වන විටත් ඇගයීම් කර අනුමැතිය ලබා දී නොතිබුණි. | එම කොන්ත්‍රාත් වලින් තව දුරටත් අනුමැතිය ලබා දීමට ඇත්තේ කොන්ත්‍රාත් 17 ක් සඳහා පමණක් වන අතර ඉතිරි කොන්ත්‍රාත් සඳහා අනුමැතිය ලබා දී ඇත. | ස්ථාවර තාක්ෂණික කමිටු අනුමැතීන් ලබා දීම ප්‍රමාදයකින් තොරව සිදු කළ යුතුය. |
| (ඈ) | නිවාස යෝජනා ක්‍රම යටතේ නිවාස ඉදිකර ඇති පෞද්ගලික ඉඩම් 64 ක සංඛ්‍යාවක් මුදල් ගෙවා පවරා ගත යුතු විය. 2019 වර්ෂයේ ඉඩම් 09ක් සඳහා | එක් එක් වර්ෂය තුල ගෙවිය යුතු වන්දි හා පොලී මුදල් අදාල ප්‍රාදේශිය ලේකම් වරුන් විසින් දන්වා එවූ පසු එම වර්ෂයට ලැබී | අදාල පාර්ශවයන්ට වන්දි ගෙවා කඩිනමින් ඉඩම් පවරා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වන්දි හා පොළී මුදල් ගෙවා අවසන් කර තිබූ අතර, තවත් ඉඩම් 06ක් සඳහා වන්දියට අදාල පොලිය පමණක් ගෙවා තිබුණි. | ඇති භාණ්ඩාගාර ප්‍රතිපාදන මගින් ගෙවීම් කරනු ලැබේ. ඒ අයුරින් හිමිකම් පරීක්ෂණ කටයුතු මත කඩිනම් කර වැඩි ඉඩම් සංඛ්‍යාවක් සඳහා වන්දි හා පොලී මුදල් දන්වා එවන ලෙස අදාල ප්‍රාදේශීය ලේකම් වරුන් වෙත දන්වා ඇත. | |
| (ඉ) | රජයේ කර්මාන්තශාලාව ප්‍රතිසංවිධානය කිරීම වෙනුවෙන් පත්කල විද්වත් කමිටු වාර්තාව 2021 වර්ෂයේ අවසාන වන විටද ඉදිරිපත් කර නොතිබුණි. ගතවී ඇති කාලය අවුරුදු 03කි. | අදහස් දක්වා නොමැත. | වාර්තාව ලබා ගැනීමට කටයුතු කර එම වාර්තාවේ නිර්දේශයන් අනුව රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව ප්‍රතිසංවිධානය කළ යුතුය. |

## 4. යහපාලනය

## 4.1 මහජනයා වෙත සේවා ඉටු කිරිම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වසර 20කට පෙර අත්පත් කර ගෙන නිවාස ඉදිකර ඇති ඉඩම් සඳහා අදාළ ඉඩම් හිමියන්ට වන්දි මුදල් ගෙවා නොතිබුණි. | එම ඉඩම්වල භුක්තිය කඩිනමින් භාර ගෙන නිවාස ක්‍රම ඉදිකර පුද්ගලයින් පදිංචි කරවා ඇත.අයිතිය සනාථ කිරීම සඳහා හිමිකම් පරීක්ෂණ වලට හිමිකරුවන් ඉදිරිපත් නොවීම මත වන්දි ගෙවා අවසන් කිරීමට නොහැකි වී ඇත. තවද ප්‍රාදේශිය ලේකම් කාර්යාල වල පවතින ආකාර්යක්ෂමතාවද මේ සඳහා බලපා ඇති බවද සඳහන් කළ යුතුය.එහෙත් එම කටයුතු කඩිනමින් කරන ලෙස එක් එක් ලිපිගොනුවෙන් ප්‍රාදේශිය ලේකම්වරුන් වෙත දන්වා යවා ඇත. | වන්දි මුදල් ඉල්ලුම් කර ඇති විට ඒ පිළිබඳ පරීක්ෂා කර බලා ගෙවිය යුතු වීම. |
| (ආ) | පෞද්ගලික හා රජය සතු ඉඩම් පවරා නොගෙන නිවාස ඉදිකර නිවාසලාභීන් පදිංචි කර තිබුණද එම පදිංචිකරුවන්ට ඔප්පු ලබා දීම ප්‍රමාදවීම හේතුවෙන් නිවාසවල නීත්‍යානුකූල අයිතිය ලැබී නොතිබුණි. | ඉහත ආකාරයට පදිංචි කර ඇති නිවාස ක්‍රමවල ඉඩම් පවරා දුන් පසු ඔප්පු ලබා දීමේ කටයුතු ආරම්භ කළ හැකිය.එහෙත් සහාධිපත්‍ය දේපල පැවරුණු පසුව සහාධිපත්‍ය පිඹුරු පිළියෙල කිරීම සහාධිපත්‍ය ප්‍රකාශණ පිළියෙල කිරීම ආදී කාර්යයන් සිදු වූ පසුව ඔප්පු ලබා දීම සිදු කරනු ලැබේ. | පදිංචි නිවාසලාභීන්ට ඔප්පු ලබා දීමට කටයුතු කළ යුතු වීම. |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

-------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අනුමත සේවක සංඛ්‍යාව 345ක්වූ අතර තථ්‍ය සංඛ්‍යාව 261ක් විය. ඒ අනුව පුරප්පාඩුව පවතින තනතුරු සංඛ්‍යාව 84ක් විය. | අදහස් දක්වා නොමැත. | සේවා අවශ්‍යතා සැළකිල්ලට ගෙන පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |